# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss - 2022)

**(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)**

# පෙරදිග සංගීතය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

**www.nie.lk**

# 6 ශ්‍රේණිය

| පළමු වන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාවය** | **නිපුණතා මට්ටම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • නාද සහ ශබ්ද අතර වෙනස දක්වයි.<br>• පෙරදිග, අපරදිග ස්වර නාම සහ සංකේත සන්සන්දනය කරයි.<br>• ස්ථානීය අගයෙන් යුක්තව, ස්වර ගායනයට පෙළඹෙයි. | ස්වර නාම සහ ස්වර සංකේත | ක්‍රියාකාරකම 02 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • පෙරදිග සහ අපරදිග වශයෙන් සංගීත ක්‍රම දෙකක් ඇති බව පැහැදිළි කරයි. | පෙරදිග අපරදිග වශයෙන් සංගීතයේ ස්වභාවය | ක්‍රියාකාරකම 03 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ස්වර සප්තකය ආරෝහණ අවරෝහණ වශයෙන් ගයයි.<br>• ශුද්ධ ස්වර ගායන කුසලතාව ලබයි.<br>• ස්වර ස්ථාපන ගීත ගයයි.<br>• ගීත ගයමින් රසාස්වාදයේ යෙදෙයි. | ස්වර ස්ථාපන ගීත ගායනය (නිර්දේශිත ගීත 02) | ක්‍රියාකාරකම 04 | 03 |
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.1/2.2 | • පහසුවෙන් පරිහරණය කළ හැකි සංගීත භාණ්ඩ හඳුනාගනී.<br>• එම භාණ්ඩයන්හි ස්වර පිහිටන ආකාරය වටහාගනී.<br>• එම භාණ්ඩයන්හි ස්වර සප්තකය වාදනය කරයි.<br>• එම භාණ්ඩවලින් සරල තනුවක් වාදනය කරයි.<br>• තාලානුකූල ස්වර අභ්‍යාස වාදනයේ යෙදෙයි. | සරල සංගීත භාණ්ඩ වාදනය. | ක්‍රියාකාරකම 05/06 | 03 |
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.2 | • තෝරාගත් වාද්‍ය භාණ්ඩය පිළිබඳව අවබෝධයක් ලබයි.<br>• අනෙකුත් වාද්‍ය භාණ්ඩ පිළිබඳ සරලව හඳුනාගනී. | සංගීත භාණ්ඩ හඳුනාගැනීම | ක්‍රියාකාරකම 07 | 02 |
| නිපුණතාව 5.0 | නිපුණතා මට්ටම 5.1 | • ළමා ගී ගායනය කිරීමේ කුසලතාව ලබයි.<br>• ළමා ගී රස විඳියි.<br>• ළමා ගී පදමාලා තුළ ඇති ස්වභාවය හා සුවිශේෂත්වය පිළිබඳ අවබෝධය ලබාගනී. | ගයා වයා විඳිමු ළමා ගී | ක්‍රියාකාරකම 08 | 02 |
| | | | | **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | **13** |

# 7 ශ්‍රේණිය

| පළමු වන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| නිපුණතාවය | නිපුණතා මට්ටම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • සප්තක තුන පිළිබඳ දැනුම ලබා ගනියි.<br>• ශුද්ධ ස්වර සප්තකය ආරෝහණ අවරෝහණ වශයෙන් ගයයි.<br>• ශුද්ධ ස්වර අන්තර වටහා ගනියි.<br>• උච්ච මන්ද්‍ර ස්වර පරාස තුළ ගායනය සඳහා යොමු වෙයි. | ත්‍රිවිධ සප්තක | ක්‍රියාකාරකම 1 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ස්වර ප්‍රභේද පිළිබඳ දැනුම ලබා ගනියි.<br>• කෝමළ, තීව්‍ර වශයෙන් ස්වර ඇතුළත් වන අයුරු වටහා ගනියි.<br>• ශුද්ධ, කෝමළ හා තීව්‍ර ස්වර, ප්‍රකෘති සහ විකෘති වශයෙන් වර්ග කරයි.<br>• කෝමළ තීව්‍ර ස්වර ශුද්ධ ස්වර අතර පිහිටන අයුරු වටහා ගනියි.<br>• ශුද්ධ ස්වර සමග කෝමළ හා තීව්‍ර ස්වර ගායනයට උත්සාහ ගනියි. | ස්වර ප්‍රභේද | ක්‍රියාකාරකම 2 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ශුද්ධ ස්වර සප්තකය තනි තනිව ගයමින් හැකියා ප්‍රදර්ශනය කරයි.<br>• ස්වර ඥානය වර්ධනය කර ගනියි.<br>• ස්වරවල ස්ථානීය අගය වටහා ගනියි.<br>• ස්වර අභ්‍යාස ගායනයට පෙළඹෙයි. | ස්වර සප්තකය ගායනය හා ශුද්ධ ස්වර අභ්‍යාස | ක්‍රියාකාරකම 3/4 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ප්‍රස්තාරකරණයේ සුවිශේෂතා හඳුනා ගනියි.<br>• ප්‍රස්තාර සරල ව කියවීමේ හුරුව ලබයි.<br>• ප්‍රස්තාර කිරීමේ දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාර | ක්‍රියාකාරකම 6 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • තාල සංකල්පය පැහැදිලි කරයි.<br>• තාල තබයි.<br>• විවිධ ලයවලට අයත් ගීවලට තාල තබයි.<br>• ලයෙහි ප්‍රභේද නම් කරයි.<br>• | තාලය හා ලය සංකල්පය | ක්‍රියාකාරකම 7/8 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • තිතෙහි ප්‍රභේද නම් කරයි.<br>• තනි තිතට අයත් ප්‍රභේද නම් කරයි.<br>• තනි තිතට අයත් පද ප්‍රස්තාර කරයි. | තනි තිත හා තාල පද | ක්‍රියාකාරකම 10 | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • තනි තිතට සමාන හින්දුස්ථානි තාල පද ප්‍රස්තාර කරයි. | | | |
| නිපුණතාව 5.0 | නිපුණතා මට්ටම 5.1 | • දේශාභිමානී ගීතවල පද සංකල්පනාවන් පිළිබඳ ව සොයා බලයි.<br>• දේශාභිමානී ගීත රස විඳිමින් ගායනය කරයි. | දේශාභිමානී ගීත ගායනය | ක්‍රියාකාරකම 11 | 01 |
| නිපුණතාව 6.0 | නිපුණතා මට්ටම 6.2 | • නිර්දේශිත නූර්ති ගීතයක් ගායනය කරයි. | නූර්ති ගීත ගායනය | ක්‍රියාකාරකම 12 | 01 |
| | | | | **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | **13** |

# 8 ශ්‍රේණිය

| පළමු වන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාවය** | **නිපුණතා මට්ටම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • බිලාවල් රාගයේ යෙදෙන ස්වර හඳුනා ගනියි.<br>• බිලාවල් රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ගයයි.<br>• බිලාවල් රාගයේ ස්වර නිවැරදිව ගයයි.<br>• රාගධාරී සංගීතය හැදෑරීමට පෙලඹෙයි. | බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත | ක්‍රියාකාරකම 1 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.2 | • මාත්‍රා, විභාග, තාලස්ථාන, ආවර්ත යන පාරිභාෂික පද පැහැදිලි කරයි.<br>• එම කොටස් තාලයක පිහිටන අයුරු විස්තර කරයි. | තාලයක කොටස් | ක්‍රියාකාරකම 2 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.2 | • මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානි තාල පද නම් කරයි.<br>• එම තාල පද හඳුන්වයි.<br>• ඣප්තාල්, දීප්චන්දි තාල අතින් නිරූපණය කරයි. | හින්දුස්ථානී තාල පද (ඣප්තාල් - දීප්චන්දි) | ක්‍රියාකාරකම 3 | 01 |
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.1 | • ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගීතයක් වාදනය කරයි. | ශුද්ධ ස්වර සහිත ගීත වාදනය | ක්‍රියාකාරකම 4 | 01 |
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.1 | • ස්වර වාද්‍ය භාණ්ඩයන්හි ස්වර ඉපදවීම පිළිබඳ ව හුරුව ලබා ගනියි.<br>• තමා වයන වාද්‍ය භාණ්ඩයේ හස්ත සාධන ක්‍රම හඳුනා ගනියි.<br>• හස්ත සාධන අභ්‍යාස වාදනය කිරීම මඟින් වාදන හැකියාවන් දියුණු කර ගනියි. | ස්වර වාද්‍ය භාණ්ඩ සඳහා හස්ත සාධන අභ්‍යාස | ක්‍රියාකාරකම 5 | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.1 | • ස්වර වාද්‍ය භාණ්ඩයෙන් ශුද්ධ ස්වර සහිත ගීතයක් වාදනය කරයි.<br>• තාලය, ලය, රිද්මය, වැනි කරුණු පිළිබඳව සැලකිලිමත්ව වාදනය කරයි. | ශුද්ධ ස්වර සහිත ගීත වාදනය කරයි | ක්‍රියාකාරකම 6 | 02 |
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.1 | • සිතාරය හා එස්රාජයේ ස්වභාවය හඳුනා ගනියි.<br>• සිතාරය හා එස්රාජයේ ස්වර පිහිටීම හඳුනා ගනියි. | සිතාරය හා එස්රාජයේ ස්වභාවය හා ස්වර පිහිටීම | ක්‍රියාකාරකම 7/8 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ගොයම් ගීත ගායනය කරයි.<br>• දේශීය අනන්‍යතාව පැහැදිලි වන මෙම ගීතවල වටිනාකම අගය කරයි.<br>• සාමූහික බව දනවන ගීත විශේෂයක් බව පිළිගනියි.<br>• ගොයම් කැපීමේ දී ගයන ගීත විශේෂයක් බව ප්‍රකාශ කරයි. | ගොයම් ගී ගායනය | ක්‍රියාකාරකම 9 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • නූර්ති ගීත ශෛලිය පිළිබඳව අවබෝධයක් ලබාගනී.<br>• නූර්ති ගීත ගායනය කරයි. | නූර්ති ගී ගායනය | ක්‍රියාකාරකම 10 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • නව නාට්‍ය ගීත ගායනය කරමින් රස විඳියි | නව නාට්‍ය ගී ගායනය | ක්‍රියාකාරකම 11 | 01 |
| | | | | **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | **13** |

# 9 ශ්‍රේණිය

| පළමු වන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාවය** | **නිපුණතා මට්ටම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • මවුගුණ ගීතයක් රස විඳියි.<br>• මවුගුණ ගීතයක් ගායනයේ හුරුව ලබයි.<br>• මවුගුණ ගීතයේ පද මාලාවේ අරුත පැහැදිලි කරයි. | මව්පිය ගුණ වරුණ ගී ගායනය (අම්මා සඳකි, සියක් ආයු ලැබ, ආදරයේ උල්පත, දුනුකෙයියා මලක්) | ක්‍රියාකාරකම 01 | 01 |
| නිපුණතාව 6.0 | නිපුණතා මට්ටම 6.1 | • නූර්ති ගීතයක් ගායනය/වාදනය කරයි. | නූර්ති ගීත ගායනය. | ක්‍රියාකාරකම 02 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • බිලාවල් රාගයට අදාළ මුඛ්‍යාංගය/ස්වර සංගති ගායනය/වාදනය කරයි.<br>• බිලාවල් රාගයට අයත් සර්ගම් ප්‍රබන්ධ ගායනය/වාදනය කරයි. | බිලාවල් රාගයේ ස්වර අභ්‍යාස හා සර්ගම් ප්‍රබන්ධ ගායනය/වාදනය. | ක්‍රියාකාරකම 03 B | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • බිලාවල් රාගයේ ආරෝහණ අවරෝහණ සමග මධ්‍යලය ගීතය ගායනය/වාදනය කරයි. | බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය ගායනය/වාදනය. | ක්‍රියාකාරකම 04 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.3 | • රාගධාරී සංගීතයේ මූලධර්ම හා බැඳි එක් එක් පාරිභාෂික පද පැහැදිලි කරයි. | ථාටය, (මේලය), රාගය, ජාතිය, වාදී, සංවාදී, අනුවාදී, විවාදී, වර්ජිත ස්වර යන පාරිභාෂික පද | ක්‍රියාකාරකම 6 A | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ලක්ෂණ ගීතයන්හි අන්තර්ගතය පිළිබඳ ව දැන ගනියි.<br>• බිලාවල් රාගයට අයත් ලක්ෂණ ගීතයක් ගායනය කරයි.<br>• | බිලාවල් රාගයට අයත් ලක්ෂණ ගීත ගායනය කරමින් රාග ලක්ෂණ විමසයි | ක්‍රියාකාරකම 8 | 01 |
| නිපුණතාව 7.0 | නිපුණතා මට්ටම 7.1 | • විදුලි ඕගනයේ මූලිකාංග නම් කරයි.<br>• විදුලි ඕගනයේ මූලිකාංග ඇසුරින් අවශ්‍ය හඬ/නාද සකස් කරගැනීමේ අවබෝධයක් ලබයි. | විදුලි ඕගනයේ මූලිකාංග හඳුනාගනී. | ක්‍රියාකාරකම 9 | 01 |
| නිපුණතාව 7.0 | නිපුණතා මට්ටම 7.1 | • විදුලි ඕගන්/සර්පිනාවෙන් සරල ගීතයක් වාදනය කරයි. | විදුලි ඕගන්/සර්පිනාවෙන් සරල ගීතයක් වාදනය කිරීම. | ක්‍රියාකාරකම 11 | 01 |
| නිපුණතාව 7.0 | නිපුණතා මට්ටම 7.1 | • ගිටාරයේ තත් සුසර කරන අයුරු හා ස්වර පිහිටන අයුරු හඳුනා ගනියි.<br>• minor සහ major කෝඩ්ස් කිහිපයක් වාදනය කරන අයුරු හඳුනා ගනියි. | ගිටාරයේ ස්වර පිහිටීම | ක්‍රියාකාරකම 12 | 02 |
| නිපුණතාව 5.0 | නිපුණතා මට්ටම 5.3 | • කණ්ඩායම් ගීත පිළිබඳව හඳුනා ගනිමින් විස්තර කරයි.<br>• කණ්ඩායම් ගීයක් ගායනය කරයි. | කණ්ඩායම් ගීතයක් ගායනය | ක්‍රියාකාරකම 14 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.2 | • මිශ්‍ර මත් කැටි සහිත බටහිර තාල පද නම් කරයි.<br>• මිශ්‍ර මත් කැටි සහිත බටහිර තාල පද ලියා දක්වයි.<br>• මිශ්‍ර මත් කැටි සහිත බටහිර තාල පද අත්තල යොදා පෙන්වයි. | $^{5}{}_{4}$, $^{7}{}_{4}$ Rhythms (බටහිර තාල) | ක්‍රියාකාරකම 16 | 01 |
| **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | | | | | **13** |

# 10 ශ්‍රේණිය

| පළමු වන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| නිපුණතාවය | නිපුණතා මට්ටම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ස්වර අභ්‍යාස නිවැරදි ව ගායනය කරමින් ස්වර ඥානය වර්ධනය කරගනියි.<br>• විවිධ රටාවන්ට අනුව භෛරවී රාගයෙන් ස්වර අභ්‍යාස ගොඩ නැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | භෛරවී ස්වර අභ්‍යාස | ක්‍රියාකාරකම 1 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • සර්ගම් මතකයෙන් ගායනය කරයි.<br>• සර්ගම් ප්‍රබන්ධයේ ලක්ෂණ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | භෛරවී රාගය - සර්ගම් | ක්‍රියාකාරකම 2 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • භෛරවී රාග විස්තර හඳුන්වයි.<br>• ලක්ෂණ ගීතය නිවැරදි ව ගායනය කරයි.<br>• ලක්ෂණ ගීතය ප්‍රස්තාරය ඇසුරෙන් එහි ඇතුළත් රාග විස්තර උපුටා දක්වයි. | භෛරවී ලක්ෂණ ගී | ක්‍රියාකාරකම 3 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • භෛරවී රාගාශ්‍රිත නාදමාලා හඳුනා ගනියි.<br>• භෛරවී මධ්‍යලය ගීතය නිවැරදි ව ගායනය කිරීමේ කුසලතාවය ලබයි.<br>• රාග රස උද්දීපනය වන සේ භාවාත්මක ව ගායනා කරයි. | භෛරවී රාගයේ මධ්‍යලය ගී | ක්‍රියාකාරකම 4 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ස්වර අභ්‍යාස නිවැරදි ව ගායනය කරමින් ස්වර ඥානය වර්ධනය කරගනියි.<br>• විවිධ රටාවන්ට අනුව යමන් රාගයෙන් ස්වර අභ්‍යාස ගොඩ නැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | යමන් ස්වර අභ්‍යාස | ක්‍රියාකාරකම 5 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • සර්ගම් මතකයෙන් ගායනය කරයි.<br>• සර්ගම් ප්‍රබන්ධයේ ලක්ෂණ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | යමන් රාගය - සර්ගම් | ක්‍රියාකාරකම 6 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • යමන් රාග විස්තර හඳුන්වයි.<br>• ලක්ෂණ ගීතය නිවැරදි ව ගායනය කරයි. | යමන් ලක්ෂණ ගී | ක්‍රියාකාරකම 7 | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • ලක්ෂණ ගීතය ප්‍රස්තාරය ඇසුරෙන් එහි ඇතුළත් රාග විස්තර උපුටා දක්වයි. | | | |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • යමන් රාගාශ්‍රිත නාදමාලා හඳුනා ගනියි.<br>• යමන් මධ්‍යලය ගීතය නිවැරදි ව ගායනය කිරීමේ කුසලතාවය ලබයි.<br>• රාග රස උද්දීපනය වන සේ භාවාත්මක ව ගායනා කරයි. | යමන් රාගය මධ්‍යලය ගී | ක්‍රියාකාරකම 8 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ප්‍රස්තාර කියවීමට අවශ්‍ය සංකේත හඳුනා ගෙන භාවිත කරයි.<br>• ස්වර ප්‍රස්තාර තාලානුකූල ව කියවයි.<br>• වෘත්තීය වාදකයකු වීමට අවශ්‍ය කරන මූලික හැකියා වර්ධනය කර ගනියි. | ස්වර ලිපි කියවීමේ ශිල්ප ක්‍රම | ක්‍රියාකාරකම 10 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ස්වර ප්‍රස්තාර අනුව ස්වර පුවරුව වාදන පුහුණුව ලබයි.<br>• ස්වර පුවරුවෙන් ගීතයක් වාදනය කරයි. | ස්වර ලිපි බලා ස්වර පුවරුවෙන් වාදනය කරයි | ක්‍රියාකාරකම 12 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • ස්වර ප්‍රස්තාර අනුව ස්වර වාද්‍ය භාණ්ඩ වාදන පුහුණුව ලබයි.<br>• තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩයෙන් ගීතයක් වාදනය කරයි. | තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර ලිපි බලා වාදනය | ක්‍රියාකාරකම 13 | 01 |
| | | | | **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | **13** |

# 11 ශ්‍රේණිය

| පළමු වන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාවය** | **නිපුණතා මට්ටම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • මධ්‍යලය ගීත ඉදිරිපත් කිරීමේ දී රාගයට අදාළ ආරෝහණ, අවරෝහණ ගායනය/වාදනය කරයි.<br>• රාගවලට අයත් විකෘති ස්වර, විවාදි ස්වර, වර්ජිත ස්වර අවධානයෙන් යුතුව භාවිත කරයි.<br>• මධ්‍යලය ගීත නිවැරදිව ගායනය/වාදනය කරයි. | බිලාවල්, භූපාලි, කාෆි යන රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාස | ක්‍රියාකාරකම 1 | 03 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.1 | • බිලාවල් භූපාලි, කාෆි යන රාගවලින් එක් රාගයකට අදාළ තානාලංකාර නිවැරදිව ගායනය/වාදනය කරයි.<br>• තානාලංකාර, තාලානුකූලව ඉදිරිපත් කරයි.<br>• ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | බිලාවල්, භූපාලි, කාෆි යන රාගවලින් එක් රාගයකට අදාළ තානාලංකාර ගායනය/වාදනය | ක්‍රියාකාරකම 2 | 02 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.2 | • නිර්දේශිත තාල පද ප්‍රස්තාර කරයි.<br>• තාලයට ගැළපෙන ගී පද තෝරයි.<br>• ගී පාදයන්ට ගැලපෙන තාල නම් කරයි. | තාල හඳුනා ගැනීම හා තාල පද ප්‍රස්තාර කිරීම | ක්‍රියාකාරකම 3 | 01 |
| නිපුණතාව 1.0 | නිපුණතා මට්ටම 1.2 | • නිර්දේශිත තාල පදවල සංඥා විස්තර කරයි.<br>• තාල සංඥා අනුව තාල පද අතින් නිරූපණය කරයි.<br>• නිර්දේශිත තාල පද තබ්ලාවෙන් වයනවිට හඳුනාගෙන නම් කරයි. | නිර්දේශිත තාලපද අතින් නිරූපණය හා තබ්ලාවෙන් හඳුනා ගැනීමේ අභ්‍යාස | ක්‍රියාකාරකම 4 | 02 |
| නිපුණතාව 4.0 | නිපුණතා මට්ටම 4.1 | • සබරගමු වන්නම් ගායනය කරයි.<br>• සබරගමු වන්නම්වල ස්වභාවය විමසයි. | සබරගමු වන්නම් - (කෝකිල වන්නම) | ක්‍රියාකාරකම 5 | 01 |
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.1 | • තෝරාගත් ගීතයක් ස්වර පුවරුවෙන් වාදනය කරයි.<br>• Chords භාවිත කරමින් ගීතය අලංකාරවත් ව වයයි. | ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ වාදනය | ක්‍රියාකාරකම 6 | 01 |
| නිපුණතාව 2.0 | නිපුණතා මට්ටම 2.1 | • තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩයෙන් කැමති ගීතයක් වාදනය කරයි. හෝ තබ්ලාවෙන් තාලයක් සමග අලංකාර වාදනය කරයි. | තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩ වාදනය/තබ්ලාව වාදනය. | ක්‍රියාකාරකම 7 | 03 |
| | | | | **පළමු වන වාරය කාලච්ඡේද එකතුව** | **13** |